SEASL


# නිල් පිහිනුම් කකුළු පුවත් හසුන්
# අංක 14

*ශ්‍රී ලංකාවේ නිල් පිහිනුම් කකුළු ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (එෆ්අයිපී) (FIP) ජාතික ධීවර ආයතනයේ කකුළු කවුන්සිලය සහ ශ්‍රී ලංකාවේ මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමය විසින් 2013 මැයි මාසයේදී ආරම්භ කරන ලද අතර නිල වශයෙන් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් නොවැම්බර් මාසයේදී දියත් කරන ලදී. එෆ්අයිපී (FIP) යනු ත්‍රෛපාර්ශ්වීය මුලපිරීමක් වන අතර එය ධීවරයින්, මුහුදු ආහාර සමාගම් සහ රජයේ ආයතන එකට එකතු කර ජීව විද්‍යාත්මක හා පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම සහ පෝක් බොක්ක සහ මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිත නිල් පිහිනුම් කකුළු ධීවර කර්මාන්ත කළමනාකරණය කරයි. ශ්‍රී ලංකාවේ නිල් පිහිනුම් කකුළු නිෂ්පාදන සඳහා සැපයුම් දාමවල සාධාරණය හා වගකීම සහතික කිරීමට ද එෆ්අයිපී (FIP) ක්‍රියා කරයි.*

*පෝක් බොක්කෙහි සහ මන්නාරම් ද්‍රෝණියේ පිහිටි නිල් පිහිනුම් කකුළු ධීවර කර්මාන්තය ශ්‍රී ලංකාවේ ඇති එකම ධීවර කර්මාන්තය සහ මොන්ටෙරේ බේ ඇක්වාරියම්හි සීෆුඩ් වොච් වැඩසටහනෙන් (2018 දෙසැම්බර්) හොඳ විකල්පයක් ලබා ගත් දකුණු හා ගිනිකොණදිග ආසියාවේ පළමු නිල් පිහිනුම් කකුළු ධීවර කර්මාන්තය වන අතර සමුද්‍රීය භාරකාරත්ව මණ්ඩලයේ ධීවර ප්‍රමිතියට එරෙහිව (2020 මැයි) 0.80 වැඩි ලකුණු ලබාගත් ධීවර කර්මාන්තයද වේ.*

## නිල් පිහිනුම් කකුළු තොගයේ ජීව විද්‍යාත්මක තත්ත්වය වැඩි දියුණු කිරීම


මන්නාරම් ද්‍රෝණියේ නිල් පිහිනුම් කකුළුවන් තොගයේ තත්ත්වය පිළිබඳ 6 වන වාර්ෂික තක්සේරුව 2020 සැප්තැම්බර් 7 සිට දෙසැම්බර් 30 දක්වා කාලය තුළ සිදු කරන ලදී. දත්ත රැස් කිරීම පෙලාජිකොස් පුද්ගලික සමාගම සහ පුත්තලම් සහ මන්නාරම් දිස්ත්‍රික්කවල ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (ඩී.එෆ්.ඒ.ආර්) දිස්ත්‍රික් ධීවර නිලධාරීන් දින දහයක් තුළ ධීවර ප්‍රජාවන්, මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සහයෝගයෙන් සිදු කරන ලදී. මන්නාරම් දිස්ත්‍රික්කයේ (වාන්කාලයි සහ තලුපාඩු) තොටුපොළවල් දෙකකින් සහ පුත්තලම් දිස්ත්‍රික්කයේ එකතු කිරීමේ මධ්‍යස්ථාන හතරකින් (තොටුපොළවල් 12 ක්) ගැහැණු කකුළුවන් 7,847 ක් මනින ලදී. දිග පදනම් කරගත් ප්‍රවේශයක් භාවිතා කර මන්නාරම් ද්‍රෝණියෙහි නිල් පිහිනුම් කකුළුවන් තොගයේ බිත්තර දැමීමේ හැකියාව ඇස්තමේන්තු කර ඇත. මෙම යෙදුම Barefoot Ecologist’s Toolbox වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. ප්‍රතිඵල - බිත්තර දැමීමේ හැකියාව = 33% කි (දකුණ බලන්න) - මන්නාරම් ද්‍රෝණියෙහි නිල් පිහිනුම් කකුළු තොගයේ සමස්ත තත්ත්වය 2020 දී හොඳ මට්ටමක (> 30%) පැවති බව එමගින් යෝජනා කරයි.




| | |
|---|---|
| ටී.ආර්.පී | 30% |
| 2015 | 31% |
| 2016 | 46% |
| 2017 | 41% |
| 2018 | 37% |
| 2019 | 57% |
| 2020 | 33% |

මන්නාරම් ද්‍රෝණියෙහි නිල් පිහිනුම් කකුළුවන් තොගයේ තත්ත්වය (එනම් බිත්තර දැමීමේ හැකියාව) 2019 දී 57% සිට 2020 දී 33% දක්වා අඩු වී ඇත. තොග තත්ත්වය අඩුවීමට බොහෝ දුරට ඉඩ ඇත්තේ නියැදි ලබාගත් ආකාරය නිසාය. 2019 දී තොගය නියැදි කරන ලද්දේ උපරිම අභිජනන හැකියාව ඇති කාලය තුළ ය. මෙම අස්වැන්නේ වැඩි ප්‍රමාණයක් විශාල (>ග්‍රෑම් 200), පරිණත ගැහැණු කකුළුවන්ගෙන් බහුල විය. 2020 තොග තක්සේරුකරණයේ ප්‍රතිඵලවලින් පෙනී යන්නේ ධීවර කටයුතු, ඉලක්ක යොමු ස්ථානයේ (ටී.ආර්.පී) හෝ ඊට ඉහළින් ක්‍රියාත්මක වන බවයි (බිත්තර දැමීමේ හැකියාව = 30%); එනම් තිරසාර ධීවර කර්මාන්තයකට සමාන මට්ටමක් බවයි.

2020 දී අල්ලා ගන්නා ලද ගැහැණු කකුළුවන්ගේ සාමාන්‍ය ප්‍රමාණය මි.මී. 149 (ග්‍රෑම් 191) විය. කකුළුවන් ප්‍රමාණයෙන් මි.මී. 115 සිට 191 දක්වා (ග්‍රෑම් 100 - 402) වූ පරතරයේ විය. මනින ලද කකුළුවන්ගෙන් 18% ක් 1 වන ශ්‍රේණියේ (> ග්‍රෑම් 200) විය. මනින ලද කකුළුවන්ගෙන් බහුතරය 3 වන ශ්‍රේණියේ (41%, කුඩා: ග්‍රෑම් 100 - 149). කකුළුවන්ගෙන් 36% ක් මධ්‍යම (2 වන ශ්‍රේණිය: ග්‍රෑම් 150 - 199) ප්‍රමාණයේ විය. අස්වැන්නෙන් නිරීක්ෂණය කරන ලද කකුළුවන්ගෙන් 8% ක් ඉතා කුඩා විය (4 වන ශ්‍රේණිය: < ග්‍රෑම් 100 / < මි.මී 115 ) විය.




මන්නාරම් ද්‍රෝණියෙහි 2017 සහ 2018 දී සැපයුම් දාමයන්හි ඉතා කුඩා කකුළුවන් (4 වන ශ්‍රේණිය : <ග්‍රෑම් 99 ) පිළිබඳ සැළකිල්ල, ධීවරයින් සහ මුහුදු ආහාර අපනයන කර්මාන්තය විසින් මතු කරන ලදී (වම බලන්න). 2018 දී පුත්තලම් දිස්ත්‍රික්කයේ මනින ලද කකුළුවන්ගෙන් 26% ක් ඉතා කුඩා ප්‍රමාණයේ (4 වන ශ්‍රේණිය) විය. මෙම කකුළුවන්ගෙන් 16% ක් නොමේරූ කකුළුවන් විය.

මුහුදු ආහාර අපනයන කර්මාන්තය විසින් 2019 දී සහ 2020 දී වගකීමෙන් යුතුව මිලදී ගැනීම නිසා සැපයුම් දාමයේ ඉතා කුඩා කකුළුවන් අඩු විය. 2020 දී මන්නාරම් ද්‍රෝණියෙන් මිලදී ගත් කකුළුවන්ගෙන් 8% ක් 4 වන ශ්‍රේණියේ (<ග්‍රෑම් 99) විය. මෙම ගැහැණු කකුළුවන්ගෙන් 5% ක් නොමේරූ කකුළුවන් විය.

## නිල් පිහිනුම් කකුළු ධීවර කර්මාන්තයේ පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම


**ඉලක්කගත නොවන විශේෂයන්ට ඇති පාරිසරික බලපෑම්:** නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී, ශ්‍රී ලංකාවේ මෝරුන් සහ මඩුවන් පිළිබඳ මෑතකදී ප්‍රකාශයට පත්කරන ලද නව පර්යේෂණයකට ප්‍රතිචාර වශයෙන්, ආප්ප මඩුවන්ගේ වර්ගීකරණ හා රූප විද්‍යාව පිළිබඳ සමාලෝචනයක් (දකුණ බලන්න - *ටෙලාට්‍රයිගොන් සුගී* *Telatrygon zugei*, කලින් *ඩැසියාටිස් සුගී* *Dasyatis zugei* ) සිදු කරන ලදී [1].



ඉල්ලක්කගත නොවන විශේෂ වල තක්සේරුව සඳහා එකතු කරන ලද ටෙලාට්‍රිගොන් සුගීගේ (*Telatrygon zugei*) නියැදියක ඉදිරිපස දර්ශනය

මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද පුවත්පතට අනුව, 2015 සිට 2019 දක්වා කාලය තුළ ඉලක්කගත නොවන විශේෂ අධ්‍යනයේදී, එෆ්.අයි.පී. විසින් හඳුනාගෙන ඇති *ටෙලාට්‍රයිගොන් සුගී* (*Telatrygon zugei)* ලෙස දැන් හඳුන්වනු ලබන *ඩැසියාටිස් සුගී* (*Dasyatis zugei)* ලෙස පෙර හැඳින්වූ මඩු (ස්ටිං රේ) විශේෂය, සැබවින්ම *බෙව්ට්‍රයිගොන් ඉම්බ්‍රිකාටා* (*Brevitrygon imbricata)* (ස්කේලි ස්ටිං රේ හෝ බෙංගාල විප්රේ) (Scaly stingray or Bengal whipray) නම් වූ විශේෂය හෝ *බෙව්ට්‍රයිගොන් විශේෂ 1* (*Brevitrygon species1)* නම් නව විශේෂයකි. මෙම සොයා ගැනීම පදනම් වී ඇත්තේ 2019 ප්‍රනාන්දු සහ වෙනත් අය විසින් මෙහෙයවන ලද මන්නාරම් ද්‍රෝණිය සහ පෝක් බොක්කෙහි සිදුකරන ලද කුඩා දුඹුරු පැහැති මඩුවන්ගේ ( ස්ටිං රේ) අණුක විශ්ලේෂණයන් මත ය.

සොබාදහම සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමය (අයි.යූ.සී.එන්) රතු ලැයිස්තුවේ සඳහන් කරන්නේ බී. ඉම්බ්‍රිකාටා (*B. imbricata*) දත්ත ඌන බවයි [2]. මෙම විශේෂය *බෙව්ට්‍රයිගොන් විශේෂ 1* නම් නව විශේෂයක් ලෙස සනාථ වුවහොත් එය ද දත්ත ඌන විශේෂයක් ලෙස වර්ගීකරණය කෙරේ. එවිට මොන්ටෙරේ බේ ඇක්වාරියම් හි (MBA) සීෆුඩ් වොච් වැඩසටහනේ ධීවර කර්මාන්ත සඳහා වන නිර්ණායකයන්ට අනුව බී. ඉම්බ්‍රිකාටා (*B. imbricata*) හෝ *බෙව්ට්‍රයිගොන් විශේෂ 1* (*Brevitrygon sp1*) හි තත්වය ද්විතීයික සුළු වේ.





ප්‍රනාන්දු සහ වෙනත් අය විසින් 2019 දී එකතු කරන ලද බී. ඉම්බ්‍රිකාටා (*B. imbricata*) ගේ නිදර්ශකය. අ. පරිණත පිරිමි සතෙකුගේ ඉදිරිපස පෘෂ්ඨය. ආ. පරිණත පිරිමි සතෙකුගේ වලිගයේ පාදයේ කටු සහ දත්

[1] ප්‍රනාන්දු සහ වෙනත් අය, 2019. ශ්‍රී ලංකාවේ එලස්මොබ්‍රාන්ච් සත්ත්ව විශේෂයන් පිළිබඳ නව අවබෝධයක්. සූටැක්සා 4585 (2): 201-238.
[2] මංජාජි මැට්සුමෝටෝ, බී.එම්., ලාස්ට්, පී.ආර්. සහ වයිට්, ඩබ්ලිව්.ටී. 2016. බ්‍රෙවිට්‍රිගොන් ඉම්බ්‍රිකාටා. තර්ජනයට ලක් වූ විශේෂවල අයියුසීන් රතු ලැයිස්තුව 2016:

මන්නාරම් ද්‍රෝණියෙහි වඳවීමේ තර්ජනයට ලක්ව ඇති, තර්ජනයට ලක්වූ සහ ආරක්ෂිත (ඊටීපී) ඉලක්කගත නොවන සාගර විශේෂ හතරකට කබර මුල්ලා (*Sousa plumbea*), මුහුදු ඌරා (*Dugon dugong*), ගල් කැස්බෑවා (*Chelonia mydas*) සහ බටු කැස්බෑවා (*Lepidochelys olivacea*) - කුඩා පරිමාණ ධීවරයින්ගෙන් ඇති විය හැකි බලපෑම පිළිබඳව සොයා බැලීමට භූගෝලීය තොරතුරු පද්ධතිය පදනම් කරගත් අධ්‍යයනයක් 2020 ඔක්තෝම්බර් මාසයේදී පඬුවාවල[3] විසින් ප්‍රකාශයට පත් කරන ලදී. එක් එක් විශේෂ සඳහා ස්ථාන දත්ත ගෝලීය දත්ත සමුදායන් භාවිතා කරමින් සහ අධ්‍යයන ප්‍රදේශයේ ධීවරයින් සහ සංචාරක ක්‍රියාකරුවන්ගෙන් ලබා ගන්නා ලදී. මුහුදු පෘෂ්ඨීය උෂ්ණත්වය, හරිතප්‍රද අ (a), මුහුදේ ගැඹුර, වෙරළේ සිට දුර, විවිධ සමෝච්ඡ රේඛාවලට ඇති දුර සහ සාගර වාසස්ථාන වැනි පාරිසරික පරාමිතීන් භාවිතා කරමින් මැක්සන්ට් මෘදුකාංගය භාවිතා කරමින් මෙම විශේෂ හතරේහි ව්‍යාප්තිය විශ්ලේෂණය කරන ලදි. ධීවර දැල් එලන ස්ථාන වල ව්‍යාප්තිය සහ විශේෂවල වාසස්ථාන වල ව්‍යප්තිය අතර අතිච්ඡාදනය වන ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස ගණනය කර එක් එක් ධීවර දැල් වර්ගය හේතුවෙන් විශේෂ හතරක් සඳහා ඇති අවදානම විශ්ලේෂණය කරන ලදී.



අධ්‍යනයේ දී භාවිතා කරන ලද විශේෂවල ව්‍යාප්තිය පෙන්වන ආකෘති මගින් එක් එක් විශේෂයන් සඳහා වාසිදායක ප්‍රදේශ ඉස්මතු කර දැක්වීය. විශේෂ වල ව්‍යාප්තිය සමඟ මධ්‍යස්ථ අතිච්ඡාදන ප්‍රතිශතයක් මෝර දැල් ධීවර කර්මාන්ත ප්‍රදේශ වලින් ඇත. එනම් කබර මුල්ලා (12%), මුහුදු ඌරා (15%) සහ ගල් කැස්බෑවා (17%) සහ ඉහළ මට්ටමේ අතිච්ඡාදනයක් බටු කැස්බෑවා (25%) සමඟ වේ. එමනිසා, මෙම විශේෂ සඳහා මෝර දැල් මගින් ඇති අවදානම 'මධ්‍යස්ථ' සිට 'ඉහළ' දක්වා විය හැකිය. අධ්‍යනයේ ප්‍රතිඵල මගින් මඩු දැල් මගින් එක් එක් විශේෂයට ඇති අවදානම ද 'මධ්‍යස්ථ' සිට 'ඉහළ' දක්වා විය හැකි බව, මඩු දැල් ධීවර ප්‍රදේශ සහ විශේෂ වල ව්‍යාප්තියන්, කබර මුල්ලා (12%), මුහුදු ඌරා (15%), ගල් කැස්බෑවා (17%) සහ බටු කැස්බෑවා (25%) අතර අතිච්ඡාදන ප්‍රතිශත මගින් නිගමනය කර ඇත. නිල් පිහිනුම් කකුළු දැල් සහ එක් එක් විශේෂවල, කබර මුල්ලා (12%), මුහුදු ඌරා (7%), ගල් කැස්බෑවා (9%) සහ බටු කැස්බෑවා (4%) සඳහා අන්තර්ක්‍රියාකාරිත්වයේ සමස්ත අවදානම් තක්සේරුව මධ්‍යස්ථ මට්ටමේ සිට අවම මට්ටමක පැවතුනි.




**සමුද්‍රීය වාසස්ථාන කෙරෙහි ඇති පාරිසරික බලපෑම්:** 2020 ජුනි මාසයේදී පෝක් බොක්කෙහි සාගර වාසස්ථාන සඳහා නිල් පිහිනුම් කකුළු ධීවර කර්මාන්තයෙන් ඇති පාරිසරික බලපෑම පිළිබඳ යාවත්කාලීන වාර්තාවක් එෆ්අයිපී විසින් ප්‍රකාශයට පත් කරන ලදී (විස්තර සඳහා පුවත් හසුන් 13 බලන්න). යාවත්කාලීන කරන ලද විශ්ලේෂණයට අනුව නිල් පිහිනුම් කකුළු ධීවර කර්මන්තයෙන් බලපෑමට ලක්විය හැකි මුහුදු තෘණ භූමි ප්‍රමාණය හෙක්ටයාර 7,958 ක් හෝ පෝක් බොක්කෙහි ඇති මුහුදු තෘණ භූමි ප්‍රමාණයෙන් 10% ක් වේ. පෝක් බොක්කෙහි නිල් පිහිනුම් කකුළු දැල් සහ කොරල් / හුණුගල් ගල්පර ව්‍යාප්තිය අතර අතිච්ඡාදනය 0.94% (හෙක්ටයාර 68.84) සහ කඩොලාන සඳහා 0.2% / හෙක්ටයාර 1.2 යක් විය. මන්නාරම් ද්‍රෝණිය සඳහා අනුරූප සංඛ්‍යා වූයේ කඩොලාන (0.71%), මුහුදු තෘණ (16.73%) සහ කොරල් / හුණුගල් ගල්පර (5.64%).

[3] පඬුවාවල, පී. පී. 2020. කුඩා පරිමාණ ධීවර කටයුතුවලදී ඉලක්කගත නොවන සාගර ජීවීන්ට ඇති අවදානම් තක්සේරුවක් (මන්නාරම් ද්‍රෝණියේ භූගෝලීය තොරතුරු පද්ධති පදනම් කරගත් සිද්ධි අධ්‍යයනයක්),පශ්චාත් උපාධි විද්‍යා පීඨය, භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.


## ධීවර කළමනාකරණය වැඩි දියුණු කිරීම



**ධීවර විශේෂිත කළමනාකරණ පද්ධති:** මන්නාරම, කිලිනොච්චි, යාපනය, සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල පොලිසියේ සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා සැප්තැම්බර් මාසයේ දී ධීවර දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලදි. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ නීති නිලධාරී සාලිකා වඩුතන්ත්‍රි මහත්මිය විසින් මෙම වැඩසටහන් සැලසුම් කර මෙහෙයවන ලදී. මෙම වැඩසටහන් මගින් 1996 අංක 2 දරණ ධීවර හා ජලජ සම්පත් පනතේ ප්‍රධාන අංග හඳුන්වා දුන් අතර සෑම දිස්ත්‍රික්කයකම ධීවර කර්මාන්තයට අදාළ ප්‍රධාන රෙගුලාසි, සංශෝධන සහ නියෝග ඉස්මතු කරන ලදී. පළමු වැඩසටහන් දෙක මන්නාරම සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සැප්තැම්බර් 24 සහ 25 යන දිනවල පවත්වන ලද අතර එයට 59 දෙනෙකු සහභාගී වූහ. අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කණ්ඩායම නිල් පිහිනුම් කකුළුවන් ධීවර කර්මාන්ත රෙගුලාසියේ අවසන් කෙටුම්පත දෙසැම්බර් මාසයේදී සාර්ථකව නිම කරන ලදී. ඇස් ප්‍රමාණය අවම වශයෙන් 4½"(මි.මී. 114.5) ක දැලක් සැකසීමෙන් සහ බර ග්‍රෑම් 100 ට වඩා අඩු කකුළුවන් නිෂ්පාදන මිලදී ගැනීම සැකසීම සහ අපනයනය කිරීම තහනම් කිරීමට, නියම කිරීමෙන් අස්වැන්නක සිටින නොමේරූ (<99 ග්‍රෑම් / <115 මි.මී.) කකුළුවන් පිළිබඳ ගැටළුව රෙගුලාසිය මගින් විසඳනු ලැබේ.

## සැපයුම් දාමයන්හි ආර්ථික සමානාත්මතාවය සහ සමාජ වගකීම වැඩි දියුණු කිරීම

**කොවිඩ් 19:** ගෝලීය කොවිඩ්19 වසංගතය හේතුවෙන් 2020 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ මිල තියුණු ලෙස පහත වැටුණි (-60%). මෙයට හේතු වූයේ උතුරු ඇමරිකාවේ සහ යුරෝපයේ නිල් පිහිනුම් කකුළු නිෂ්පාදන සඳහා පාරිභෝගික ඉල්ලුම නොමැතිකමයි. මිල ගණන් ජුනි මාසයේ සිට යථා තත්ත්වයට පත් විය (-46%). පෝක් බොක්කෙහි පරිසර නිර්දේශිත නිල් පිහිනුම් කකුළු ධීවර කර්මාන්තය සඳහා සාමාන්‍ය වෙරළ මිල දෙසැම්බර් මාසයේදී වර්ෂය ආරම්භයේදී ගෙවන ලද මිල ගණන් වලට සාපේක්ෂව 32% කින් අඩු විය. මෙම මිල ගණන් ධීවර සමුපකාර සමිති 18 කින් එකතු කරන ලදී.




**ආර්ථික සමානාත්මතාවය:** 2020 දෙසැම්බරයේ පෝක් බොක්ක නිල් පිහිනුම් කකුළු ධීවර කර්මාන්තයේ සාමාන්‍ය වෙරළ මිල (ලංකා රුපියල් 496.00) 2019 ජනවාරි මාසයේ දී ගෙවන ලද මිල ගණන් වලට සාපේක්ෂව 43% අඩු ය (ලංකා රුපියල් 871.00); මෙය සීෆුඩ් වොච් විසින් ධීවර කර්මාන්තය **පරිසර නිර්දේශිත** කිරීමෙන් වසර දෙකකට පසුවය. එක්සත් ජනපද ආනයනකරුවන්ට අනුව, උතුරු ඇමරිකාවේ සීෆුඩ් වොච් පරිසර නිර්දේශිත නිල් පිහිනුම් කකුළු නිෂ්පාදන සඳහා ඉල්ලුමක් නොමැත. මෙයින් අදහස් කරන්නේ එක්සත් ජනපද ආනයනකරුවන්ට, ශ්‍රී ලංකා නිෂ්පාදකයින්ට සහ කුඩා පරිමාණ ධීවරයින්ට ශ්‍රී ලංකාවේ අද්විතීය ආසියානු නිල් පිහිනුම් කකුළු නිෂ්පාදන සඳහා **පරිසර මිල වාරිකයක්** ලබා ගැනීමට තවමත් නොහැකි වී ඇති බවයි.

**සමාජ වගකීම:** වාර්තා කරන කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ නිල් පිහිනුම් කකුළුවන් සඳහා සැපයුම් දාමයන්හි සමාජ වගකීම වැඩි දියුණු කිරීම සඳහා එෆ්.අයි.පී. කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.


**ජාතික ධීවර ආයතනයේ කකුළුවන් කවුන්සිලය** 2013 සිට එෆ්.අයි.පී හි අඛණ්ඩ සහ නොමසුරු සහයෝගය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ නිල් පිහිනුම් කකුළු එෆ්.අයි.පී එකම ආයතනික සාමාජික - **ටැප්‍රොබේන් සීෆුඩ් සමූහ පුද්ගලික සමාගම** - ශ්‍රී ලංකාවේ මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ මන්නාරම් ද්‍රෝණියෙහි සහ පෝක් බොක්කෙහි පිහිටි නිල් පිහිනුම් කකුළු ධීවර ප්‍රජාවන් අඛණ්ඩව කෘතඥ වෙනවා. **ශ්‍රී ලංකා නිල් පිහිනුම් කකුළුවන් පුවත් හසුන්** සංස්කරණයේ විස්තර කර ඇති ක්‍රියාමාර්ග එකක් හෝ කිහිපයක් සම-මූල්‍යකරණය කිරීම පිළිබඳව එෆ්අයිපී සාමාජිකයින් **ඒෂියා පදනමට** සහ **සීඑම් බ්ලූ ක්‍රැබ් පුද්ගලික සමාගමට** ස්තුතිවන්ත වෙති.


*නිල් පිහිනුම් කකුළු පුවත් හසුන් සංස්කරණයන් දහහතරේම මෘදු පිටපත් ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවෙන් www.pelagikos.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. නැතහොත් ඔබට පුවත් හසුන් පිටපත් සහ එෆ්අයිපී (FIP) පිළිබඳ වැඩිදුර තොරතුරු මෙම විද්‍යුත් තැපෑලෙන් ඉල්ලා සිටිය හැකිය* steve@pelagikos.lk